**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 223 වැනි සංවත්සර සැමරුම් පණිවුඩය.**

ශ්‍රී ලංකාවේ ඉපැරණි ම හා ප්‍රථම දෙපාර්තමේන්තුව වන ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව ක්‍රි.ව.1800 වර්ෂයේ නිකිණි මස දෙවෙනිදා එවකට රජයේ වැඩබලන ලේකම් විලියම් බෝයිඩ් මහතා විසින් ගාල්ලේ දී නිකුත් කරන ලද රාජ ආඥාවකට අනුව පිහිටුවන ලදි. එහි ප්‍රථම සර්වේයර් ජනරාල් වශයෙන් ජෝශප් ජෝන්විල් මහතා පත්විය. මිනින්දෝරුවන් පස්දෙනෙකුගෙන් ඇරඹි මෙම දෙපාර්තමේන්තුව, මේ වන විට මිනින්දෝරු වෘත්තිකයින්, සිතියම් තාක්ෂණ නිලධාරීන්, මැනුම් ක්ෂේත්‍ර සහයකයින් හා ඒකාබද්ධ සේවාවන් සමග සමස්ත කාර්ය මණ්ඩලය හය දහසක් පමණ වේ. මෙම දෙපාර්තමේන්තුව මෙරට භූමිතික තොරතුරු නිෂ්පාදනය කර බෙදා හැරීමේ පුරෝගාමියා වෙමින් ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු සඳහා අඛණ්ඩව සිය සේවා සපයමින් අභිමානවත් කාර්ය භාරයක් ඉටු කරන අතර, 223 වසරක අභිමානයේ ප්‍රවේශය සනිටුහන් කරන මොහොතේ එහි 53 වන සර්වේයර් ජනරාල් තනතුර හෙබවීමට හැකිවීම මාගේ ජීවිතයේ ලද පරම භාග්‍යක් බව සතුටින් සඳහන් කරමි.

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වටිනාකම හා පිළිගැනීම ජාතියට පවරමින් ඉතිහාසයේ දැවැන්ත කාර්ය භාරයක් ඉටුකර ඇති අතර, මූලික පිඹුරු සැකසීම, ගම් සිතියම් සැකසීම, දුම්රිය මාර්ග ඉදිකිරීම සඳහා වූ මැනුම්, විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා හා වාරි ව්‍යාපෘතිවලට අදාළ මැනුම්, විවිධ සංවර්ධන කටයුතු සඳහා වූ  අත්පත් කර  ගැනීමේ මැනුම්, නගර මැනුම්, හා ශ්‍රී ලංකාව පිහිටුවන ලද භූමිතික හා මට්ටම් ජාලය යනාදිය උදාහරණ ලෙස දැක්විය හැකිය.  වර්තමානයේ ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව ලොව ඉහළම තාක්ෂණික ක්‍රමවේද යොදා ගනිමින් සිදුකරන දත්ත රැස්කිරීම මගින් පිඹුරු සැකසීම හා සිතියම්කරණය සිදුකරන අතර, බිම් සවිය වැඩසටහන යටතේ හිමිකම් ලියාපදිංචි කිරීමේ මැනුම් මගින් ශ්‍රී ලංකාවේ සෑම බිම් කැබැල්ලකටම නිරවුල් අයිතියක් ලබාදීම සඳහා වූ කැඩැස්තර මැනුම් කර සිතියම් පිළියෙල කිරීම සිදු කරනු ලබන අතර, මෙරට තුළ ඉදිවන උතුරු, මධ්‍යම, හා රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘති මෙන්ම කෘෂිකාර්මික මෙන්ම විවිධ වගා ව්‍යාපෘති සඳහා ද නවීන තාක්ෂණය යොදා ගනිමින් මහඟු කාර්ය භාරයක් ඉටු  කරනු ලබයි.

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට වසර 223 ක ප්‍රෞඪ ඉතිහාසයක් උදාකර දීමට උත්සුකව එදා මෙදා තුර ඇප කැප වී සේවය කළ හිටපු සර්වේයර් ජනරාල්වරුන් පනස් දෙදෙනා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට මාගේ ගෞරවනීය ප්‍රණාමය පුදකිරීමට මෙය අවස්ථාවක් කර ගැනීමට මා බලාපොරොත්තු වන අතර, වර්තමානය වන විට අප රට තුළ ඇති ආර්ථික හා සමාජීය අර්බුදකාරී තත්ත්වයන් හමුවේ වුවද එකාවන්ව එක්සිත්ව හැකි අයුරින් තම රාජකාරී කටයුතු නොපිරිහෙලා ඉටුකරන වර්තමාන මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයට ද මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙනුවෙන් මාගේ ගෞරව ප්‍රණාමය පුද කර සිටිමි. " නව සියවසට පියවරක්  " යන තේමාව යටතේ සංවර්ධන ප්‍රවේශයට සමගාමීව රාජ්‍ය සේවයේ නියැලීමට අපේක්ෂාවෙන් ගෙන දී ඇති පුරවැසි ප්‍රඥප්ති, මාර්ගගත සේවා සැපයීමේ ක්‍රම, සේවා විමධ්‍යගත කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම, මාර්ගගත සේවා සැපයීමේ ක්‍රම හඳුන්වාදීම වැනි කටයුතු සිදු කිරීමට අදිටන් කර ගනිමින් අප දෙපාර්තමේන්තුවේ ඊළග පියවර තැබීමට සුහදව අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතුව අත්වැල් බැඳගෙන රටේ අනාගත සෞභාග්‍ය කරා ගෙන යාමට සමස්ත කාර්ය මණ්ඩලයට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

එස්.සිවානන්දරාජා
සර්වේයර් ජනරාල්